# <u>නිවේදනය</u> D

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද **"දේශීය ආදායම්"** නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

(1). පනත් කෙටුම්පතෙහි 97, 98 සහ 100(1)(ඉ) වැනි වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි ව්‍යවස්ථාවට අනනුකූල වන බව හා

167 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12, 13 සහ 14(1)(ඌ) හා (එ) වැනි ව්‍යවස්ථාවලට අනනුකූල වන බවද;

එම වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) වැනි ව්‍යවස්ථාවට අනුව විශේෂ බහුතර ඡන්දයෙන් පමණක් සම්මත කිරීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් වන ආකාරයට සංශෝධනය කිරීම මඟින් ඉහත වගන්තිවල ඇති අනනුකූලතාවයන් ඉවත් කර ගැනීම කළ හැකි බවද;

(2). 200 වැනි වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4 වැනි ව්‍යවස්ථාවලට අනනුකූල වන බව සහ එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) වැනි ව්‍යවස්ථාවට අනුව විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කිරීමට අවශ්‍ය වන බවත් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 වැනි ව්‍යවස්ථාවට අනුව ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කළ යුතු වන බවත්

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තිරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතුයැයි නියෝග කරමි.